# කොළඹ කවිය

විදග්ධ සංස්කෘතියකට මෙරට පැවතියේ ගැමි සංස්කෘතිය පමණ ය. අපට විදග්ධ සංස්කෘතියක් නිර්මාණය කරගැනීමට තිබුණේ ගැමි සංස්කෘතිය පදනම් කරගනිමිනි. එහෙත් අප නො කෙළේ ද එයම ය. කලින් සඳහන් කර ඇති පරිදි මාර්ටින් වික්‍රමසිංහ මහතා ගැමි සංස්කෘතිය අගය කළ මුත් ඒ මහතා උනන්දු වූයේ ඒ පදනම් කරගනිමින් විදග්ධ සංස්කෘතියක් ගොඩනැගීමට නොව ගැමි සංස්කෘතියෙහි අංග බටහිර විදග්ධ සංස්කෘතිය සමග සංසන්දනය කිරීමට ය. එමගින් ගැමි සංස්කෘතියෙහි ද බටහිර ක්‍රිස්තියානි සංස්කෘතියෙහි ලක්ෂණ ඇති බව පෙන්වීමට ය. බටහිර කෙටි කතාව ජාතක කතා සමග සංසන්දනය කර ජාතක කතාවෙහි නැති යථාර්ථවාදී රීතියක් එහි ඇතැයි කීමට වික්‍රමසිංහ මහතා පෙළඹුණේ එබැවිනි.

සරච්චන්ද්‍ර මහතාට ද ගැමි සංස්කෘතිය අවශ්‍ය වූයේ මනමේ සිංහබාහු නිර්මාණයෙහි දී ය. ඉන් ඔබ්බට ගොස් ගැමි නාටකය මත පදනම් ව සිංහල නාට්‍ය සම්ප්‍රදායක් ගොඩනගාගැනීමට ඒ මහතාට නො හැකි විය. සිංහල කවිය සම්බන්ධයෙන් ගුණදාස අමරසේකර මහතාට එයට වඩා දුර ගමනක් යා හැකිව තිබුණි. එයට හේතුව දැනුමේ සාපේක්ෂතාව හා දැනුම නිර්මාණය කෙරෙන්නේ කෙසේ ද යන්න පිළිබඳව පසුගිය දශක දෙකකට වැඩි කාලයක් තිස්සේ කෙරීගෙන ගිය සංවාදය ඒ මහතාට යම් පමණකින් වුවත් බලපා ඇති බැවිනි. එහෙත් ඒ පිළිබඳ නිසි අවබෝධයක් ඒ මහතාට නොතිබීමත් ඉංගිරිසි කවිය හා සිංහල කවිය අතර වෙනස හරිහැටි තේරුම් නොගැනීමත් හේතුවෙන් ඒ මහතාට ද සිංහල කාව්‍ය සම්ප්‍රදායක් ගොඩනගා ගැනීමට නොහැකි වී ඇති බව පෙනී යයි.

අප කලින් සඳහන් කර ඇති පරිදි සිංහල කවිය කියවීමට නොව කීමට ය. ශබ්ද නගා කීම සිංහල කවියට උරුම වූවකි. එහෙත් ඉංගිරිසි කවිය කියවීමට ය. ඉංගිරිසි ෆ්‍රී වර්ස් යන්න ද ඉංගිරිසි කාව්‍ය සම්ප්‍රදායෙහි නිර්මාණය වූවකි. එය නිසඳැස් නමින් පරිවර්තනය කර සිංහල සම්ප්‍රදායෙන් බැහැර වූ කවි නිර්මාණය කළ ජී බී සේනානායක මහතා සිංහල කවිය පරිහානියට පත්කිරීමට නොදැනුවත් ව කටයුතු කෙළේ ය. සේනානායක මහතාගේ නිසඳැස් කවිය හේතුවෙන් අද ඊනියා කවීහු බොරු දාර්ශනික වැල්වටාරම් වචන දෙකට තුනට කඩා ලියති. ඒ ඊනියා කවිවල දාර්ශනික සංකල්ප නැත්තේ කවි ලියන ඉතා  වැඩි පිරිස ව්‍යාජ දාර්ශනිකයන් මිස දාර්ශනිකයන් නොවන බැවිනි.

අනෙක් අතට කවිය ඇත්තේ දර්ශනය කතාකිරීමට නො වේ. දාර්ශනික සංකල්ප ප්‍රකාශ කිරීමට කවිය කිසිසේත්ම සුදුසු මාධ්‍යයක් නො වෙයි. කවියාට ඇත්තේ විසිරුණු අදහස් ය. සංකේන්ද්‍රගත නිශ්චිත අදහස් කවියකුට නැත. මෙය කවියට පමණක් නොව සමස්ත කලා ක්ෂෙත්‍රයට ම පොදු වූවකි. කලාව හා විද්‍යාව අතර  ඇති ප්‍රධාන වෙනස ද  එය ය. කලාවෙහි නිරූපණය වන්නේ සංයුක්ත අදහස් ය. ඒ එක් සිද්ධියකට හෝ සිද්ධි මාලාවකට සීමා වෙයි. කවිය බොහෝ විට තනි සිද්ධියකට සිමා වෙයි. නවකතාව සිද්ධි මාලාවකට සීමා වෙයි. ඒ සිද්ධියක් වුවත් සිද්ධි මාලාවක් වුවත් එහි ඇත්තේ විශේෂිත සිද්ධි ය. එහෙත් විද්‍යාවෙහි දී හා දර්ශනයෙහි දී ඒ එසේ නො වෙයි.

විද්‍යාවෙහි දී හා දර්ශනයෙහි දී කතාකෙරෙන්නේ තනි සිද්ධියක් හා විශේෂිත සිද්ධි මාලාවක් ගැන නොව සාධාරිත සංකල්ප පිළිබඳ ව ය. සාධාරිත යන්න මෙහි දී යොදා ගැනෙන්නේ පොදු යන අර්ථයකින් මිස සාධාරණයක් ඉටුවිය යන අර්ථයකින් නො වෙයි. සාධාරිත යන්නට විශේෂිත සිද්ධි අඩංගු විය නො හැකි ය. සාධාරිත යන්නෙන් සිද්ධි රාශියකට පොදු වූ යන අරුත ගෙන දෙයි. එමෙන් ම බොහෝ විට සාධාරිත සංකල්ප වියුක්ත වෙයි. ඒ අතර සාධාරිත සංකල්පවලින් නිශ්චිත අර්ථ ද ගෙන දෙයි. මෙයින් පැහැදිලි වන්නේ බටහිර වුවත් පෙරදිග වුවත් විද්‍යාවෙහි හා දර්ශනයෙහි අනෙක් අන්තයෙහි කවිය ඇති බව ය. කවියන් දාර්ශනිකයන් වීමට වලිකනු දැකීම තරම් සිනහ උපදවන තවත් දෙයක් නිර්මාණ ලෝකයෙහි දැකගත නො  හැකි ය.

විශේෂයෙන් ම සිංහල කවියන් දාර්ශනිකයන් වීමට උත්සාහ කරනු දැකීම ම සිනහ උපදවයි. සිංහල විද්‍යාව හා සිංහල දර්ශනය එතරම් වියුක්ත නො වෙයි. සිංහල ශාස්ත්‍රීය සම්ප්‍රදාය ඇත්තේ කාව්‍යමය අන්තයට සමීපව මිස විද්‍යා හා දාර්ශනික අන්තය පැත්තේ නො වේ. එබැවින් සිංහල කවීන් බොරු දාර්ශනිකයන්  වීමට තැත් කිරීම කවින්ට මෙන් ම

© Prof. Nalin De Silva

දාර්ශනිකයන්ට ද කරන  නිග්‍රහයකි. ඊනියා ෆ්‍රී වර්ස් හෙවත් නිදහස් කාව්‍යයක් පදනම් කරගනිමින් නිසඳැස් යනුවෙන් බොරු දාර්ශනික කවි නිර්මාණය කළවුන් අද පවතින කාව්‍ය දුර්භික්ෂයට වග කිව යුතු ය.

මෙරට විදග්ධ ගැමි සංස්කෘතිය විසින් නිර්මාණය කෙරුණු කාව්‍ය සම්ප්‍රදායක් අපට ඇත. ඒ සම්ප්‍රදායෙහි බිහිවුණු කාව්‍ය රාශියක් ද වෙයි. අපේ බොරු විදග්ධයන්ට ඒ සම්ප්‍රදායෙන් අළුත් දෙයක් නිර්මාණය කිරීමේ හැකියාව නො වී ය. ඔවුන්ට කළ හැකි වූයේ කොළඹ කවියේ අගුණ දැකීම පමණ ය. කොළඹ කවිය යනුවෙන් හඳුන්වනු ලැබුයේ මෙරට කාව්‍ය සම්ප්‍රදායේ එකතරා අවධියක දී ලියැවුණු කවි ය. ඒ කවිවලට ඉතිහාසයක් හා සම්භවයක් ඇත. ඒ නොසළකා කොළඹ කවියට බැණ වැදීම අර්ථ විරහිත විය.

කොළඹ කවියෙහි මොන තරම් අඩුපාඩුකම් තිබුණත් ඒ කවි පොත් මහජනයා අතර ප්‍රචලිත විය. කොළඹ කවියෙහි අඩුතම සැලකිල්ලට භාජනය වූ කවි කොළය පවා අතිවිශාල ජනතාවක් විසින් කියවුණු ලැබිණි. අද මුළු රටේම අවුරුද්දක කාලයක විකිණෙන කවි පොතක පිටපත් සංඛ්‍යාවට වඩා කවි කොළ සංඛ්‍යාවක් එදා ගම්බද පොළක දී එක් වරුවක් තුළ විකිනෙන්නට ඇත. එයට හේතුව බටහිරයන්ගේ අවශ්‍යතාව පිරිදි සිංහලෙන් අද ලියැවෙන කවි සිංහල කවී නො වීම ය.

සිංහලයන් අද පළවන කවි නොකියවන්නේ නම් එයට හේතුව අප විදග්ධ ගැමි සංස්කෘතිය නොසළකා හැරීම ය. බ්‍රිතානි අධ්‍යාපන ක්‍රමයෙන් ගැමි සංස්කෘතිය නොවැදගත් සංස්කෘතියක් ලෙස සළකා ඒ පිළිබඳ අධ්‍යයනයක් නො කිරීම එයට තවත් හේතුවක් වෙයි. අප කොළඹ කවිය මූලික වශයෙන් දුටුවේ එක්තරා ආකාරයකින් එළිසමය රකින ගතානුගතික සම්ප්‍රදාය එලෙසම පවත්වාගෙන යෑමට ඉවහල් වන ග්‍රාම්‍ය සම්ප්‍රදායක් ලෙස ය.

එළිසමය සිංහල කාව්‍ය සම්ප්‍රදායට කවදා වද්දාගන්නට ඇත්දැයි නො දනිමු. එහෙත් එයින් යම්කිසි ප්‍රබෝධයක් වී ඇති බව පැහැදිලි ය. දඹදෙණි යුගයේ ද ඉන්පසුව ද එළිසමය රැකගත් රසවත් සිංහල කවි බිහිවී ඇත. වරද ඇත්තේ එළිසමයේ නොව කොළඹ කවිවල කාව්‍යමය ගුණය හීන වීම ය. එසේ වීමට විවිධ හේතු වෙයි. අපේ පරාධීන කාලය දික්වීම සිංහල උගතුන් සමාජයේ අන්තයට ඇද දමා ඉංගිරිසි උගතුන් ඒ තැනට පත්වීම ආදිය ද මෙහි දී කැපී පෙනෙන ලක්ෂණ වෙයි.

කාව්‍ය සංකල්පනාවලට වඩා සිද්ධිවලට අනවශ්‍ය තැනක් ලබාදීමක් කොළඹ කවියේ දක්නට ඇත. කාව්‍ය සංකල්පනාවක් යනු දාර්ශනික සංකල්පයක් නොවුණ ද එහි රසවත් බවක් ඇත. එහි විසිරුණු ස්වභාවය ම කවියේ රසය තවත් වැඩි කෙළේ ය. අනෙක් අතට කොළඹ කවි ලියුවෝ සිංහල පමණක් දැන සිටි උගත්තු ම නොවූහ. ඔවුන් අතර ඉංගිරිසි උගත්තු ද සිටියහ. එහෙත් මේ ඉංගිරිසි උගතුන්  ඉංගිරිසි නොදත් සිංහල කවියන්ට අවට ලෝකය ගැන ඉහැන්වූ බවක් දැකගන්නට නැත. සිංහල කවි ලිවීමට එලෙස ඉංගිරිසි උගතුන්ගෙන් හෝ වෙනත් අයකුගෙන් හෝ ලෝකය ගැන අවබෝධයක් ලබා සිටිය යුතු යැයි මෙයින් නො කියැවෙයි.

කොළඹ කවියෙහි කාව්‍ය නොවන ලක්ෂණ විවේචනය කර කවියන් යහමග යවා එමගින් අළුත් සංස්කෘතියක් බිහිකර ගැනීමට ඊනියා කාව්‍ය විචාරකයන් සූදානම් ව නො සිටීම ප්‍රශ්නයක් විය. ඔවුන්ට සැමදාමත් කළ හැකි වූයේ කොළඹ කවියන් නිර්දය ලෙස විවේචනය කිරීම පමණ ය. එයින් අත් වූ සුගතියක් නො වී ය. කොළඹ කවීන් යැයි සැලකෙන බොහෝ දෙනකුට අර විචාරකයන් දඬු ගසේ ගැසීමට තරම් දැනුමක් වූ නමුත් ඔවුහු ඒ සඳහා ඉදිරිපත් නො වූහ. එහෙත් දිගින් දිගටම ඔවුන් නිර්දය විචාරයට පත්කරනු ලැබූ බැවින් ඔවුහු නිර්මාණයට එතරම් තැනක් නො දුන්හ.

ඒ කෙසේ වුවත් මෙරට ගැමි ජනයා ශබ්දනගා කවියක් කීමට පුරුදුව සිටියහ. අද පවා රුස්වීමක කවි කතාවක් කෙරෙන්නේ නම් සියල්ලෝ ම වෙනත් කතාවලට වඩා කවි කතාවට ඇහුම්කන් දෙති. ඒ  කවිකතා ද බොහෝමයක් එළිසමය රැකගත් කවිවලින් සමන්විත විය.  එවැනි කවිකතාවලින් මහජනයාට යම් පණිවුඩයක් ද දෙනු ලැබිණි. අපේ සමාජයේ කලා ක්ෂේත්‍රවලින් මහජනයාට පණිවුඩයක් අවශ්‍ය වෙයි. එහෙත් අද කවිවලින් හෝ වෙනත් කලා ක්ෂේත්‍රවලින් හෝ එවැනි පණිවුඩ ජනතාවට නො ලැබෙයි.

© Prof. Nalin De Silva

මේ සියල්ල අමතක කර කොළඹ කවියට බැණ වැදීමෙන් කවියට වූ සෙතක් නැත. ඊනියා නිසැඳසක් බිහිවීමට ඉඩ සැලැස්වීමෙන් සිදු වී ඇත්තේ කවිය මුළුමනින් ම මෙන් මැරී යෑමට ඉඩ සැලැස්වීමක් පමණකි, අද ඒ තත්වයෙන් ගොඩ ඒමට විශාල වෑයමක් දැරිය යුතුව ඇත. එහෙත් මෙහි දී වෙනත් ප්‍රශ්නයක් පැන නගියි. මෙරට ගැමි සංස්කෘතිය විදග්ධ නම් එවැනි සංස්කෘතියක් කොළඹ කවිය වැනි කවියක් බිහිවීමට ඉඩ හැරියේ ඇයි ද යන්න ඒ ප්‍රශ්නය වෙයි.

කොළඹ කවිය බිහිවූයේ ගැමි සංස්කෘතියේ තිබූ ප්‍රශ්නයක් නිසා නොව කොළඹ යුගය වන විට විවිධ හේතු නිසා සිංහල කවිය වෙනත් මගක් ගත් බැවිනි. මේ හේතුවලින් ගණනාවක් අපි කලින් දක්වා ඇත්තෙමු. මේ සම්බන්ධයෙන් තවදුරටත් සාකච්ඡාකිරීම අවශ්‍ය වෙයි.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva